OL/2025(2026)/33/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**33 | S | I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

ඉතිහාසය I
வரலாறு I
History I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

**උපදෙස්:**

- ✻ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✻ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
- ✻ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- ✻ එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට උපකාරී වන මහානාම හිමි විසින් රචිත සාහිත්‍ය මූලාශ්‍රය කුමක් ද?
(1) දීපවංශය (2) මහාවංශය (3) ධාතුවංශය (4) ථූපවංශය

**2.** සකස් කරගත් ගල් කුලුණු මත ලියා ඇති අභිලේඛන හඳුන්වනු ලබන නම කුමක් ද?
(1) ලෙන් ලිපි (2) පුවරු ලිපි (3) ටැම් ලිපි (4) ගිරි ලිපි

**3.** ප්‍රාග් ඓතිහාසික යුගයේ මළසිරුරු වළ දැමීම පිළිබඳ සාක්ෂි හමු වී ඇති ස්ථානයක් වන්නේ මින් කුමක් ද?
(1) කිතුල්ගල බෙලිලෙන (2) රත්නපුර මැණික් පතල්
(3) රංචමඩම සුසාන භූමිය (4) ඉරණමඩු සැකැස්මට අයත් බොරලු තට්ටුව

**4.** අතීතයේ ගම් වැව් නඩත්තු කිරීමේ කාර්යය පැවරී තිබුණේ,
(1) ගෘහපතිට ය. (2) ගමිකට ය. (3) පරුමකට ය. (4) මපුරුමකට ය.

**5.** පැරණි ශ්‍රී ලංකාවේ කාසි අච්චු ගැසීමේ ප්‍රධාන නිලධාරියා හැඳින්වීමට සෙල්ලිපිවල භාවිත කළ නම කුමක් ද?
(1) අස අදෙක (2) රූප අදෙක (3) නට අදෙක (4) හති අදෙක

● පහත A, B, C හා D ප්‍රකාශ ඇසුරෙන් **6** සහ **7** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – යාපනය ප්‍රදේශය පාලනය කිරීමට සාමිහිරි ඇමතිවරයා පත් කිරීම
B – චෝළ බලය මැඩපැවැත්වීම
C – ප්‍රාදේශීය පාලකයින් පරාජය කර රාජ්‍යත්වයට පත් වීම
D – ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

**6.** පණ්ඩුකාභය රජතුමා හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**7.** වසභ රජතුමා හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**8.** "තිඹිරිගෙය" යනුවෙන් හඳුන්වන්නේ මින් කුමක් ද?
(1) ප්‍රසූතිය සඳහා ඉදි කළ ස්ථානය
(2) ගමේ ආරවුල් විසඳන ලද ස්ථානය
(3) ආගමික කටයුතු සඳහා භාවිත කළ ස්ථානය
(4) අධ්‍යාපන කටයුතු සිදු කළ ස්ථානය

**9.** පහත දැක්වෙන මිනුම් ඒකක සලකන්න.
A – ගව්ව B – පැළ C – යොදුන D – අමුණ
ඒවා අතුරෙන් දුර මැනීම සඳහා යොදාගත් මිනුම් ඒකක පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

10. **I තීරුවෙහි** පැරණි සමාජයේ පැවති විවිධ වෘත්තීන් ද **II තීරුවේ** එම වෘත්තීන් සෙල්ලිපිවල හඳුන්වා ඇති නම් ද දැක්වේ. **I තීරුව** සමග **II තීරුව** අනුපිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ගුරුවරු | A – වොහොර |
| 2. වෛද්‍යවරු | B – චිතකර |
| 3. නීති විශාරද | C – ආචාර්ය |
| | D – වෙජ |

(1) A B C (2) B C A (3) C A B (4) C D A

11. පැරණි සමාජයේ ජනයා අතුරුපසක් ලෙස අනුභව කළ ආහාරය කුමක් ද?
(1) කාඩි ඇඹුල (2) දොඩම් යුෂ (3) මී පැණි (4) තල

12. පැරණි ශ්‍රී ලංකාවේ රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් රජය අය කළ බදු වර්ගය කුමක් ද?
(1) කැති අඩ (2) දකපති (3) බොජකපති (4) මතරමජ්ඣක

13. පැරණි සමාජයේ සත්ත්ව ඝාතකයින්ට දඬුවම් පමුණුවමින් හතරවන මිහිඳු රජතුමා විසින් කරවන ලද අභිලේඛනය කුමක් ද?
(1) මිහින්තලා පුවරු ලිපිය (2) අනුරාධපුර පුවරු ලිපිය
(3) වේවැල්කැටිය සෙල්ලිපිය (4) වෙස්සගිරිය සෙල්ලිපිය

14. ගාල්ලේ ත්‍රිභාෂා සෙල්ලිපිය පිහිටුවන ලද්දේ කිනම් රාජධානි සමයේ ද?
(1) යාපනය (2) කෝට්ටේ (3) කුරුණෑගල (4) ගම්පොළ

- පහත A සිට D තෙක් ප්‍රකාශ අතුරෙන් **15** හා **16** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – ඉබන් බතූතා නම් අරාබි සංචාරකයා ශ්‍රී ලංකාවට පැමිණීම
B – සපුමල් කුමරුගේ නායකත්වයෙන් හමුදාව යවා යාපනය ජය ගැනීම
C – පන්සිය පනස් ජාතක කතා පොත සිංහලට පරිවර්තනය කිරීම
D – ගුත්තිල කාව්‍යය, ලෝවැඩ සඟරාව, ගිරා හා සැළලිහිණි සංදේශ රචනා වීම

15. කුරුණෑගල රාජධානි සමය හා සම්බන්ධ ප්‍රකාශය වනුයේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

16. කෝට්ටේ රාජ්‍ය සමය පිළිබඳ තොරතුරු දැක්වෙන ප්‍රකාශ වනුයේ,
(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා D ය.

17. ශ්‍රී ලංකාවේ රජවරුන් කිහිපදෙනකු රාජ්‍යත්වයට පත් වීමට පෙර භාවිත කළ නම් **I තීරුවේ** ද, රාජ්‍යත්වයෙන් පසු භාවිත කළ නම් **II තීරුවේ** ද දැක්වේ. **I තීරුව** අනුව **II තීරුව** අනුපිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. කන්නසාමි කුමරු | A – මායාදුන්නේ |
| 2. ටිකිරි කුමරු | B – පළමුවන රාජසිංහ |
| 3. මහා අස්ථාන කුමරු | C – ශ්‍රී වික්‍රම රාජසිංහ |
| | D – දෙවන රාජසිංහ |

(1) A B C (2) A B D (3) C A D (4) C B D

18. පහත ප්‍රකාශ අතුරෙන් පුනරුද සමයේ කලා ශිල්පවල ලක්ෂණයක් දැක්වෙන්නේ කුමකින් ද?
(1) කලා නිර්මාණ ආගමට නැඹුරු වීම
(2) කලා කෘති ඒවා නිර්මාණය කළ කතුවරුන්ගේ නමින් එළිදැක්වීම
(3) පල්ලිය පමණක් කලා නිර්මාණවලට අනුග්‍රහ දැක්වීම
(4) ආගමික වශයෙන් වැදගත් වූ පුද්ගලයන් පමණක් චිත්‍රවලට වස්තු විෂය වීම

19. පහත සඳහන් කරුණු අතුරෙන් යාපන රාජ්‍යය බිඳ වැටීමට හේතු වූ කරුණු දැක්වෙන පිළිතුර කුමක් ද?
A – යාපන රාජ්‍යයේ උරුමකරුවන් අතර ඇති වූ බල අරගල
B – යාපන ප්‍රදේශයේ කතෝලික ආගම ප්‍රචාරය කිරීම
C – යාපනයේ පාලකයන්ට ප්‍රමාණවත් නිත්‍ය හමුදාවක් නොසිටීම
D – යාපනයේ බහුතර ජනතාව පෘතුගීසීන්ට පක්ෂපාතී වීම
(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

**20.** කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි මුස්ලිම්වරුන්ට යටත්වීමෙන් පසු ආසියාවට පැමිණීමට නව මුහුදු මාර්ගයක් සෙවීමේ කටයුතුවලට යොමු වූ මුල්ම යුරෝපීය රට වූයේ,
(1) බ්‍රිතාන්‍යයයි. (2) ඕලන්දයයි. (3) පෘතුගාලයයි. (4) ප්‍රංශයයි.

**21.** කාර්මික විප්ලවය නිසා සමාජයේ ඇති වූ ප්‍රධාන වෙනසක් වූයේ,
(1) ලිබරල්වාදය, සමාජවාදය වැනි දාර්ශනික මතවල ව්‍යාප්තියයි.
(2) සාම්ප්‍රදායික කෘෂි ආර්ථික රටාව වෙනුවට ආනයන-අපනයන ආර්ථික රටාවක් බිහිවීමයි.
(3) බහුජාතික සමාගම්වල බිහිවීමයි.
(4) ධනපති පන්තියක් හා නිර්ධන පන්තියක් බිහිවීමයි.

● A සිට F තෙක් තොරතුරු ඇසුරෙන් 22 හා 23 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නිපැයුම | කර්මාන්තය |
|---|---|
| A – දුවන නඩාව | D – ගල් අඟුරු |
| B – රෝලර් යන්ත්‍රය | E – පේෂ |
| C – ආරක්ෂක ලාම්පුව | F – යකඩ හා වානේ |

**22.** ජෝන් කේ නමැත්තාගේ නිපැයුම හා එයට සම්බන්ධ කර්මාන්තය පිළිබඳ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා D (2) A හා E (3) A හා F (4) B හා E

**23.** හම්ප්‍රි ඩේවිගේ නිපැයුම හා එයට සම්බන්ධ කර්මාන්තය පිළිබඳ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) B හා D (2) B හා F (3) C හා D (4) C හා F

**24.** පහත සඳහන් බ්‍රිතාන්‍ය දූතයන් උඩරට රාජධානියට පැමිණි කාල වකවානුව අනුව පෙළගස්වා ඇති නිවැරදි පිළිතුර කුමක් ද?
A – හියු බොයිඩ් B – රොබට් ඇන්ඩෘස් C – ජෝන් පයිබස්
(1) A C B (2) B C A (3) C A B (4) C B A

**25.** ඉන්දියාවට පැමිණි බ්‍රිතාන්‍යයන් 18 වන සියවස මැද භාගය වන තෙක් ශ්‍රී ලංකාව ගැන අවධානය යොමු නොකිරීමට ප්‍රධාන හේතුව කුමක් ද?
(1) ශ්‍රී ලංකාවේ වැදගත්කම පිළිබඳ ඒ වන විට ඉංග්‍රීසින්ට පැහැදිලි අවබෝධයක් නොවීම
(2) ඉන්දියාව හා සැසඳීමේ දී ශ්‍රී ලංකාව කුඩා දූපතක් වීම
(3) පෘතුගීසින්ට හා ලන්දේසින්ට ශ්‍රී ලංකාව මුළුමනින්ම යටත් කර ගැනීමට නොහැකි වූ බව ඔවුන්ට පෙනී යාම
(4) ඉංග්‍රීසින් ඉන්දියාව තුළ ශක්තිමත් බලයක් ගොඩනගා ගෙන නොතිබීම

**26.** 1848 නිදහස් සටනට හේතුවක් වූ නව බදු ප්‍රතිසංස්කරණයක් ඇති කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා කවුරුන් ද?
(1) ෆෙඩ්රික් නෝර්ත් (2) ටොරින්ටන් සාමි (3) රොබට් බ්‍රවුන්රිග් (4) තෝමස් මේට්ලන්ඩ්

**27.** යාපනය ප්‍රදේශයේ ආගමික ප්‍රචාරක කටයුතුවල නිරත වූ මිෂනාරි සංවිධානය වන්නේ,
(1) අමෙරිකන් මිෂනාරි සංවිධානයයි. (2) බැප්ටිස්ට් මිෂනාරි සංවිධානයයි.
(3) චර්ච් මිෂනාරි සංවිධානයයි. (4) ලන්ඩන් මිෂනාරි සමාගමයි.

**28.** බෞද්ධ පුනරුද සමයේ වලිසිංහ හරිශ්චන්ද්‍රතුමා විසින් සිදු කරන ලද සේවාවක් වන්නේ මින් කුමක් ද?
(1) අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්ෂා කිරීමට කටයුතු කිරීම
(2) බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම
(3) ඉන්දියාවේ පූජනීය ස්ථාන රැක ගැනීමට කටයුතු කිරීම
(4) වෙසක් පොහොය දිනය නිවාඩු දිනයක් බවට පත් කර ගැනීමට කටයුතු කිරීම

**29.** ශ්‍රී ලංකාවේ ජාතික පුනරුද ව්‍යාපාර ක්‍රියාකාරකම් කිහිපයක් **I තීරුවේ** ද පුනරුද ක්‍රියාකාරීන් කිහිපදෙනකු **II තීරුවේ** ද දැක්වේ. **I තීරුව** අනුව **II තීරුව** අනුපිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. පෙරිය පුරාණම් ග්‍රන්ථය පරිවර්තනය කිරීම | A – පොන්නම්බලම් අරුණාචලම් මහතා |
| 2. ලංකා ජාතික සංගමය පිහිටුවීම | B – අරුමුග නාවලර්තුමා |
| 3. මද්‍රාසා පාසල් ප්‍රතිසංවිධානය | C – පොන්නම්බලම් රාමනාදන් මහතා |
| | D – සිද්දි ලෙබ්බේ මහතා |

(1) A B D (2) A C D (3) B A D (4) B C D



CS CamScanner

Past Papers Wiki



**30.** කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනාව වන්නේ මින් කුමක් ද?
(1) උඩරට හා පහතරට ඒකාබද්ධ කිරීම (2) රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම
(3) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම (4) ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම

**31.** බ්‍රිතාන්‍ය පාලන සමයේ දී වතු වගාවේ ව්‍යාප්තිය හා දියුණුව නිසා හටගත් සමාජ ගැටලුවක් වූයේ,
(1) මද්‍යසාර භාවිතය ව්‍යාප්ත වීම ය.
(2) ආනයනික භාණ්ඩ භාවිතය ප්‍රචලිත වීම ය.
(3) දේශීය කෘෂිකර්මාන්තය අඩපණ වීම ය.
(4) භාණ්ඩ හුවමාරුව වෙනුවට මුදල් භාවිතය ප්‍රචලිත වීම ය.

**32.** ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු පිහිටුවන ලද දේශපාලන පක්ෂය මින් කුමක් ද?
(1) එක්සත් ජාතික පක්ෂය (2) ලංකා කොමියුනිස්ට් පක්ෂය
(3) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (4) ලංකා සමසමාජ පක්ෂය

**33.** වියළි කලාපයේ ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ කළ තැනැත්තා වන්නේ,
(1) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා ය. (2) ඇන්.ඇම්. පෙරේරා මහතා ය.
(3) කොල්වින් ආර්. ද සිල්වා මහතා ය. (4) ඩී.එස්. සේනානායක මහතා ය.

**34.** මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉදි කළ පළමු ජලාශය කුමක් ද?
(1) වික්ටෝරියා ජලාශය (2) රන්ටැඹේ ජලාශය
(3) රන්දෙනිගල ජලාශය (4) බෝවතැන්න ජලාශය

● පහත A හා B ප්‍රකාශ අතුරෙන් 35 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A – මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
B – බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සමග පැවති ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම

**35.** ක්‍රි.ව. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන්
(1) A පමණක් සත්‍ය වේ. (2) B පමණක් සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

**36.** 1970 – 1977 කාලයේ බලයට පත් රජය අනුගමනය කළ ආයාත ආදේශක ප්‍රතිපත්තිය හා සම්බන්ධ **නොගැළපෙන** පිළිතුර කුමක් ද?
(1) ආනයනික භාණ්ඩ වෙනුවට ආදේශක දේශීය භාණ්ඩ නිෂ්පාදනය කිරීම
(2) අපනයන ආශ්‍රිත කර්මාන්ත දියුණු කිරීමට විදේශීය ධන ආයෝජකයින් මෙරටට ගෙන්වා ගැනීම
(3) රාජ්‍ය මැදිහත්වීමෙන් රට තුළ මහා පරිමාණ කර්මාන්තශාලා වර්ධනය කිරීම
(4) දේශීය ගෘහස්ථ කර්මාන්ත හා සුළු කර්මාන්ත දියුණු කිරීම

**37.** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයා පත් කරනු ලබන්නේ,
(1) ආරක්ෂක මණ්ඩල නිර්දේශය මත මහා මණ්ඩලය විසිනි.
(2) ජාත්‍යන්තර අධිකරණය විසිනි.
(3) ආර්ථික හා සමාජ මණ්ඩලය විසිනි.
(4) නිෂේධ බලය හිමි නිත්‍ය සාමාජිකයන් විසිනි.

● පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා අංක **38** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. ජර්මනිය එක්සත් කිරීම
2. පළමු ලෝක මහා සංග්‍රාමය

B – 1. අක්ෂ බලවතුන්
2. ප්‍රංශය

C – 1. නවසිවාදය
2. ප්‍රජාතන්ත්‍රවාදය

D – 1. දෙවන ලෝක මහා සංග්‍රාමය
2. ජාතීන්ගේ සංගමය

**38.** දෙවැන්නේ ආරම්භයට පළමුවැන්න ද හේතුවක් වූ බව දැක්වෙන යුගලය ඇතුළත් අක්ෂරය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**39.** පළමුවැන්නේ වර්ධනයත් සමග දෙවැන්න විනාශයට පත් වූ බව දැක්වෙන යුගලය ඇතුළත් අක්ෂරය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**40.** දෙවැන්නේ අසාර්ථකත්වය හේතුවෙන් පළමුවැන්න ආරම්භ වූ බව දැක්වෙන යුගලය ඇතුළත් අක්ෂරය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

***



CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025 (2026)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2025 (2026)
## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

විෂය අංකය / பாட இலக்கம்: **33**

විෂය / பாடம்: **ඉතිහාසය**

| ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 4 | 21. | 4 | 31. | 1 |
| 02. | 3 | 12. | 3 | 22. | 2 | 32. | 3 |
| 03. | 1 | 13. | 1 | 23. | 3 | 33. | 4 |
| 04. | 2 | 14. | 4 | 24. | 3 | 34. | 4 |
| 05. | 2 | 15. | 3 | 25. | 4 | 35. | 3 |
| 06. | 3 | 16. | 4 | 26. | 2 | 36. | 2 |
| 07. | 1 | 17. | 4 | 27. | 1 | 37. | 1 |
| 08. | 1 | 18. | 2 | 28. | 1 | 38. | 1 |
| 09. | 2 | 19. | 2 | 29. | 3 | 39. | 3 |
| 10. | 4 | 20. | 3 | 30. | 2 | 40. | 4 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40

PAST PAPERS WIKI



CamScanner

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025 (2026)

## 33 - ඉතිහාසය

### II පත්‍රය

### I කොටස

**I කොටස**

1. (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

කොළඹ, සෙංකඩගල, ගාල්ල, කල්පිටිය නගරය, ගල්ඔය ජලාශය, යාපනය නගරය, දැදුරු ඔය, නුවර වැව, මන්නාරම් නගරය, ත්‍රිකුණාමලය නගරය, කුඹුක්කන් ඔය, පදවිය වැව (ලකුණු 12 යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

බුරුමය, කැලිකට්, ස්පාඤ්ඤය, හිරෝෂිමා, මලක්කා සමුද්‍ර සන්ධිය, බෝල්ටික් මුහුද (ලකුණු 06 යි)



CamScanner

(1). (අ) (i).

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

33 | S | II


අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

ඉතිහාසය II
வரலாறு II
History II

1. (අ) (i) විභාග අංකය ..............................



**(1). (අ) (ii)**



PAST PAPERS WIKI



CamScanner

(ආ) (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ කිනම් රාජ්‍ය සමයේදී ද?

*B* - ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනයට පත් කළ ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයාගේ නම සඳහන් කරන්න.

*C* - වාෂ්ප බලයෙන් ක්‍රියාකරන දුම්රිය එන්ජිම නිපදවන ලද්දේ කවුරුන් විසින් ද?

*D* - කුඩා රාජ්‍යයන් බොහොමයක් එකතු කොට ජර්මනිය බිහි කළ නැනැත්තා කවුරුන් ද? (ලකුණු 04 යි)

(i) A. වළගම්බා / වට්ටගාමිණී අභය

B. සර් ෆ්‍රෙඩරික් නෝර්ත් /නෝර්ත්

C. ජෝර්ජ් ස්ටීවන්සන්/ස්ටීවන්සන්

D. ඔටෝ වොන් බිස්මාර්ක්/බිස්මාර්ක්

**(ලකුණු 1 x 4 = 4 යි)**


- *A* හා *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

2. මෙය සොයාගන්නා ලද ස්ථානය සඳහන් කරන්න.

3. මෙය අයත්වන ඓතිහාසික යුගය කුමක් ද?

4. මෙය සැකසීමට භාවිත කරන්නට ඇතැයි සැලකෙන තාක්ෂණික උපකරණය කුමක් ද?



*A*

(ලකුණු 04 යි)

(ii) 1. පින්තාරු කළ මැටි බඳුන/වර්ණාලේපිත මැටි බඳුන/මැටි බඳුන

2. උඩරංචාමඩම

3. පූර්ව ඓතිහාසික යුගය

4. සකපෝරුව

**(ලකුණු 1 x 4 = 4 යි)**

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන රජතුමාගේ නම සඳහන් කරන්න.

2. මෙම රජතුමා පාලනය කළ රට කුමක් ද?

3. මෙම රජතුමා අයත් වූ රාජවංශය කුමක් ද?

4. මෙතුමා වාසය කළ රජ මාලිගය හඳුන්වන ලද නම කුමක් ද?



*B*

(ලකුණු 04 යි)

(iii) 1. දහසයවන වන ලුවී රජු

2. ප්‍රංශය

3. බූර්බෝන්

4. වර්සෙල්ස් **(ලකුණු 1 x 4 = 4 යි)**



CamScanner

## II කොටස

**<u>ප්‍රශ්න අංක 02</u>**

ඉගෙනුම් පල:

***ශ්‍රී ලංකාවේ ප්‍රාග්, පූර්ව හා මුල් ඓතිහාසික යුග පිළිබඳව විමර්ශනය කරයි.***

| |
|---|
| **II කොටස** |
| **2.** (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන **තුන** සඳහන් කරන්න. (ලකුණු 03 යි) |
| (ii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාවේ දක්නට ලැබුණු ලක්ෂණ **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි) |
| (iii) පූර්ව ඓතිහාසික යුගයේ මානව ජීවිතයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි) |
| (iv) මුල් ඓතිහාසික යුගයේ ගම් ජනාවාසවල දක්නට ලැබුණු ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි) |

(i) මිනිහාගල්කන්ද
බුන්දල / වැල්ලේ ගංගොඩ
පතිරාජවෙල
උඩමළල

***(මින් තුනක් සඳහා ලකුණු 1 x 3 = 03යි)***

(ii)
- සතුන් දඩයම් කර ආහාරයට ගැනීම
- මිරිදිය මසුන් ආහාරයට ගැනීම
- පිෂ්ටය ලබාගැනීමට ශාක ආහාර භාවිත කිරීම
- ගස්ගොළුබෙල්ලන් හා කලපු බෙල්ලන් ආහාරයට ගැනීම
- ආහාර පුළුස්සා අනුභව කිරීම
- ආහාරයට ලුණු එක්කර ගැනීම
- ආහාරයේ ස්වභාවය පරිසරය අනුව තීරණය වීම
- තැන තැන ඇවිද යමින් ආහාර එකතු කර ගැනීම

***(මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2 x 2 =04යි)***

(iii)
- පිළිස්සූ මැටි වළං භාවිතය ඇරඹීම
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය කිරීම
- යකඩ ලෝහ භාවිතය ඇරඹීම
- ස්ථිර ජනාවාස හා වාසස්ථාන ගොඩනගා ගැනීම
- කෘෂිකාර්මික කටයුතු ඇරඹීම
- කාන්තාවන් රූපලාවන්‍ය කටයුතුවලට යොමු වීම

***(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2+3 =05යි)***



CamScanner

(iv) - කුඩා වැව් කේන්ද්‍රකොට ජනාවාස ඇරඹීම

- වාපි ගාම නමින් හැඳින්වීම

උදාහරණ - සුමනවාපිගාම, විහාරවාපිගාම, හුන්දරිවාපිගාම

- ගංගාවල පිටාර නිම්නයන්ට පිටතින් ජනාවාස ව්‍යාප්ත වීම

- වෘත්තීන් පදනම් කරගත් ජනාවාස බිහිවීම

උදාහරණ - කේවට්ටගාම - ධීවර ගම්

ගෝපාල ගාම - ගොපල්ලන් විසූ ගම්

කසීකාර ගාම - ගොවියන් විසූ ගම්

..............................................................

- කාර්යයන් පදනම් කරගත් ජනාවාස බිහිවීම

උදාහරණ - පට්ටන ගාම - වරාය ආශ්‍රිත ගම්

නියම්ගම - වෙළෙඳ ගම්

- ගමක පවුල් සංඛ්‍යාව 5-6 සිට 30 දක්වා වීම

- විශාලත්වය හෙක්ටයාර් 0.15 සිට 2 දක්වා වීම

- කැලෑ තීරයකින් ගම් වෙන්වීම

- ඇතැම් ගම් වැටකින් ආරක්ෂා කර තිබීම

උදාහරණ - පරික්ඛිත්ත ගාම

- ගමික විසින් ගම පාලනය කිරීම. (විධිමත් පාලන ක්‍රමයක් පැවතීම)

***(මින් කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 3+3 =06 යි)***

## <u>ප්‍රශ්න අංක 03</u>

**ඉගෙනුම් පල:**

***ශ්‍රී ලංකාවේ රාජත්ව සංකල්පය, රාජ්‍ය උරුමය හා රජවරුන්ගේ කාර්යභාරය විග්‍රහ කරයි.***

3. (i) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය

(*a*) පියාගෙන් පසු පුතාට හිමි වූ අවස්ථා **දෙකක්** ද,

(*b*) සහෝදරයාගෙන් සහෝදරයාට හිමි වූ අවස්ථා **එකක්** ද, **අනුපිළිවෙළින්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* තෙක් දී ඇති එක් එක් තොරතුර හා සම්බන්ධ රජවරුන් කවුරුන් දැයි වරහන් තුළින් තෝරා **අනුපිළිවෙළින්** දක්වන්න.

*A* - ප්‍රථමවරට දිවයිනේ ග්‍රාම සීමා සටහන් කිරීම

*B* - රුවන්වැලිසෑයට පූජාවක් පැවැත්වීම සඳහා විදුරු පබලු රැගෙන ඒමට රෝමානුක දේශයට දූත පිරිසක් යැවීම

*C* - ප්‍රථමවරට මෙරට පළාත්වලට බෙදා පරිපාලනය විධිමත් කිරීම

*D* - ළමා කල "සිත්නාරුබිම් බුදල්නා" නම් ආරක්ෂක නිලධාරියාගේ රැකවරණය යටතේ වාසය කිරීම

(දුටුගැමුණු, වසභ, දේවානම්පියතිස්ස, පණ්ඩුකාභය, මහසෙන්, I විජයබාහු, I පරාක්‍රමබාහු, භාතිකාභය) (ලකුණු 04 යි)

(iii) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ සිදු වූ ඓතිහාසික සිදුවීම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දුටුගැමුණු රජතුමාගෙන් සිදු වූ සේවාව කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)



CS CamScanner

Past Papers Wiki



(i) (a) - කාවන්තිස්ස රජුගෙන් පසු දුටුගැමුණු කුමරු රජ වීම
- වසභ රජුගෙන් පසු වංකනාසිකතිස්ස කුමරු රජ වීම

(b) - දේවානම්පියතිස්ස රජුගෙන් පසු උත්තිය රජවීම. ඉන් පසු මහාසිව, සූරතිස්ස, අසේල රජ වීම
- දුටුගැමුණු රජුගෙන් පසු සද්ධාතිස්ස කුමරු රජ වීම

***(a).අක්ෂරයෙන් දෙකක් සහ (b).අක්ෂරයෙන් එකක් සඳහා 1x 3 = 03යි)***

(ii) A - පණ්ඩුකාභය
B - භාතිකාභය
C - වසභ
D - I විජයබාහු

***(ලකුණු 2x2 =04යි)***

(iii) - නැවත අභිෂේක වීම හා දෙවනපිය අභිධානය භාවිතයට ගැනීම
- අශෝක අධිරාජයා සමග සම්බන්ධතා පවත්වා ගැනීම
- මිහිඳු හිමි බුද්දහම රැගෙන මෙරටට වැඩම වීම
- ප්‍රාදේශීය පාලකයන් අතර සුහදතාව ගොඩනගා ගැනීමට කටයුතු කිරීම
- ශ්‍රී මහා බෝධිය අනුරාධපුරයේ රෝපණය කිරීම
- ශ්‍රී මහා බෝධි ශාඛා දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම
- ථූපාරාමය ගොඩනැංවීම
- භික්ෂු-භික්ෂුණී ශාසනය ඇරඹීම
- තිසා වැව ඉදි කිරීම
- මහමෙව්නා උයන සඟ සතු කොට පූජා කිරීම

***(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 02+03 = 05)***

(iv) - විමධ්‍යගතව පැවැති දේශපාලන බලය මධ්‍යගත කිරීම
- ප්‍රාදේශීය බලය හිමිවූ පරුමකවරු ඒකාබද්ධ කිරීම
- පරුමකවරුන්ගේ සහයෝගය ලබා ගැනීම
- පරුමකවරුන්ට රජයේ ඉහළ තනතුරු ලබා දීම
- රට එක්සේසත් කිරීම
- එළාර පරාජය කිරීම
- ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය ලබා දීම
- රට වෙනුවෙන් පොදු අරමුණක් මුල්කර ගනිමින් දේශපාලන ක්‍රියාවලියකට එළඹීම
- වෙහෙර විහාර ගොඩනැංවීම
- රුවන්වැලි සෑය,මිරිසවැටිය,ලෝවාමහාපාය
- ජනතා සුබසිද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම
- රෝහල් ඉදිකිරීම
- රුවන්වැලිසෑය ඉදිකිරීමේදී දන්සැල් පැවැත්වීම හා වැටුප් ගෙවීම

***(මින් කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 03+03 =06 යි)***

PAST PAPERS WIKI



CamScanner

## ප්‍රශ්න අංක 04

ඉගෙනුම් පල:

*ශ්‍රී ලංකාවේ පැරණි විද්‍යා හා තාක්ෂණය පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.*

4. (i) ඇළහැර ඇළ මගින් ජලය සපයන වැව් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) වැවක ප්‍රධාන අංග **හතරක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) (*a*) අතීත ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණ තාක්ෂණයක් පැවති බවට තොරතුරු ලැබෙන ස්ථාන **දෙක** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) එම ස්ථානයන්හි යකඩ නිස්සාරණය සිදු කළ ආකාරය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 03 යි)

(iv) සීගිරියේ විශිෂ්ට නගර හා උද්‍යාන නිර්මාණ තාක්ෂණයක් පැවති බව කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) මින්නේරිය, ගිරිතලේ, කන්තලේ, කවුඩුල්ල

*(මින් තුනක් සඳහා ලකුණු 1 x 3 = 03 යි)*

(ii) වැව් බැම්ම, රළපනාව, සොරොව්ව, බිසෝකොටුව, වාන (ඇතුළුවාන, පිටවාන)

*(මින් හතරක් සඳහා ලකුණු 1 x 4 = 04 යි)*

(iii) (a) - බලංගොඩ සමනල වැව/සමනල වැව

- සීගිරිය අලකොලවැව/ අලකොලවැව/දෙහිගහඇලකන්ද

(b) - යකඩ සහිත ස්වාභාවික ගල් කැබලි මැටි බඳුනක දමා මරන් අඟුරු එක්කොට ස්වාභාවික සුළං ආධාරයෙන් යපස් උණු කොට යකඩ නිස්සාරණය කිරීම
(සමනල වැව)

- දෙහිගහඇලකන්ද ප්‍රදේශයේ යකඩ උඳුන් දැල්වීමට අවශ්‍ය සුළං බලය මයිනහමක ආධාරයෙන් ලබා ගැනීම.

*(කරුණු දෙක විස්තර කිරීම සඳහා ලකුණු 2 + 3= 05)*

(iv)
- හුදෙකලා පර්වතයක් ඇසුරින් නාගරික මධ්‍යස්ථානය ඉදිකිරීම
- සීගිරි පර්වතය 200m ක් පමණ උසකින් යුක්ත වන අතර එය මුදුනේ මාළිගා සංකීර්ණය ඉදිකිරීම
- පර්වතයේ බටහිර හා නැගෙනහිර රාජකීය ප්‍රවේශ දෙකක් පිහිටීම
- නගරය වටා ගැඹුරු දිය අගලක් තනා තිබීම
- ආරක්ෂාව සඳහා ගඩොලින් තැනූ උස් ප්‍රාකාරයක් දක්නට ලැබීම
- සැලසුම් සහගත උද්‍යාන සංකීර්ණයක් දක්නට ලැබීම
- අලංකරණය සඳහා ජලමල් හා පොකුණු ඉදි කිරීම
- නගරය ආශ්‍රිතව නිර්මාණය කරන ලද වැවක් තිබීම
- වර්ෂා ජලය නිසි පරිදි බැහැර කිරීමට භූගත කාණු පද්ධතියක් ඉදි කිරීම

*(මින් කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 3+3 = 06යි)*

## ප්‍රශ්න අංක 05

ඉගෙනුම් පල:

***මහනුවර රාජධානියේ පරිපාලන සංවිධානය හා පාලකයන් පිළිබඳ තොරතුරු විස්තර කරයි.***

5. (i) අයිතිය හා භුක්තිය පදනම් කරගෙන මහනුවර රාජධානියේ ඉඩම් බෙදා තිබූ කොටස් **තුනක්** ලියා දක්වන්න. (ලකුණු 03 යි)

   (ii) පළමුවන විමලධර්මසූරිය රජතුමා බලයට පත්වීමත් සමග මුහුණදුන් අභියෝග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

   (iii) මහනුවර රාජධානියේ ප්‍රාදේශීය පාලනය ක්‍රියාත්මක වූ ආකාරය කරුණු **දෙකක්** යටතේ විස්තර කරන්න. (ලකුණු 05 යි)

   (iv) කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) ගබඩාගම්, නින්දගම්, විහාරගම්, දේවාලගම් ,පරවේණිගම්

***(මින් තුනක් සදහා ලකුණු 1 x 3 = 03යි)***

(ii)
- නිත්‍යානුකූල රාජ්‍ය උරුමයක් නොවීම
- උඩරට රාජධානිය පෘතුගීසි ග්‍රහණයෙන් බේරා ගැනීම
- සීතාවක බලපෑමෙන් උඩරට රාජධානිය මුදා ගැනීම
- පරිහානියට පත් බුද්ධසසුන නගා සිටුවීම
- මහනුවර රාජධානියේ ආර්ථික කටයුතු දියුණු කිරීම

***(මින් දෙකක් සදහා ලකුණු 2 x2 = 04)***

(iii)
- ප්‍රාදේශීය පාලන සංවිධානය රටවසම ලෙස හැඳින්වීම
- රජුගේ අධීක්ෂණයෙන් ප්‍රධාන අධිකාරම්වරු මගින් පාලන කටයුතු සිදු කිරීම
- උඩරට රාජ්‍ය රට හා දිසාව ලෙස කොටස් 21 කින් සමන්විත වීම
- රට වශයෙන් හැඳින්වූ ප්‍රදේශ 9 කි.

  උදාහරණ - උඩුනුවර, යටිනුවර,තුම්පනේ,හාරිස්පත්තුව.............................
- ප්‍රදේශය භාර නිළධාරියා රටේ රාළ/රටේ මහත්වරු නමින් හැඳින්වීම
- ඔවුන් යටතේ ලියන රාල, උණ්ඩිය රාළ යන නිලධාරීන් සිටීම
- දිසාවනි 12 ක් පැවතීම

  උදාහරණ - හතර කෝරළය, හත් කෝරළය, සබරගමුව.............

  - දිසාවනිය භාර නිළධාරියා දිසාව වේ.
  - දිසාවනිය කෝරාළ හා පත්තුවලට බෙදා තිබීම
  - කෝරාළ, මුහන්දිරම්, විදානේ වැනි තනතුරු දක්නට ලැබීම
  - නිලධාරීන්ට අධිකරණ බලතල හිමිවීම

***(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2 +3 = 05 යි)***



CamScanner

(iv) - වැලිවිට සරණංකර හිමි සමග එකතු වී බෞද්ධාගමික ප්‍රබෝධයක් ඇති කිරීමට කටයුතු කිරීම
- සියම් දේශයෙන් උපසම්පදාව ගෙන ඒම
- වර්තමාන සියම් නිකායේ ආරම්භය සිදු වීම
- වෙහෙර විහාර ඉදිකිරීම
- වෙහෙර විහාර අලුත්වැඩියා කිරීම
- සංඝරාජ තනතුරක් ඇතිකොට ශාසනය සංවිධානය කිරීම
- වාර්ෂිකව දළදා පෙරහැර පැවැත්වීම
- දළදා පෙරහැරට දේවාල පෙරහැර එක් කිරීම
- ප්‍රථම ඉංග්‍රීසි දූත ගමන සිදුවීම
- ක්‍රි.ව 1766.ලන්දේසීන් සමග ගිවිසුමකට එළඹීම

*(මින් කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 3+3 = 06යි)*

**ප්‍රශ්න අංක 06**

ඉගෙනුම් පල:

***පෘතුගීසීන් හා ලන්දේසීන් කෝට්ටෙ හා මහනුවර රාජධානි සමග පැවැති සම්බන්ධතා විමර්ශනය කරයි.***

| | | |
|---|---|---|
| **6.** (i) | පෘතුගීසින් පැමිණෙන විට මෙරට පැවති රාජධානි **තුන** සඳහන් කරන්න. | (ලකුණු 03 යි) |
| (ii) | පෘතුගීසින් විසින් උඩරටට එල්ල කරන ලද ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. | (ලකුණු 04 යි) |
| (iii) | පෘතුගීසීන් විසින් කෝට්ටේ රාජ්‍යය සමග පවත්වන ලද සබඳතා කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. | (ලකුණු 05 යි) |
| (iv) | උඩරට රාජ්‍යය සම්බන්ධයෙන් ලන්දේසින් අනුගමනය කළ ප්‍රතිපත්තියේ වැදගත් ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. | (ලකුණු 06 යි) |

(i) කෝට්ටෙ
උඩරට / මහනුවර / හෝ / සෙංකඩගල
යාපනය

*(ලකුණු 1x 3 = 03 යි)*

(ii) - උඩරට ජනතාව සෑමවිටම රජුට සහාය දැක්වීම
- පෘතුගීසීන් වෙනුවෙන් සටන් කිරීමට ගිය පහතරැටියන් උඩරටදී රජුට එකතු වීම
- උඩරැටියන්ගේ සටන් උපක්‍රම
- උඩරට රජවරුන්ගේ රණශූරත්වය
- උඩරට රාජධානියේ ස්වාභාවික පිහිටීම

*(මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2x2= 04 යි)*

(iii)
- කොළඹට පැමිණීමෙන් පසු කෝට්ටේ රජු හමුවීමට නියෝජිතයන් යැවීම
- කෝට්ටේ රාජ්‍ය සමග වෙළෙඳ සම්බන්ධතා පවත්වා ගැනීම
- රජුගේ අවසරය පරිදි වෙළෙඳ ගබඩාවක් ඉදිකිරීම
- විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ හා සීතාවක රාජධානි අතර තිබූ මතභේද නිසා කෝට්ටේ හා සීතාවක අතර ඇති වූ සටන්වලදී පෘතුගීසින් කෝට්ටේ ආරක්ෂකයන් ලෙස කටයුතු කිරීම
- යුධ වියදම් රජතුමා විසින් දැරීම
- බුවනෙකබාහු රජුගේ සහාය ඇතිව කෝට්ටේ රාජ්‍ය තුළ සිටි මුස්ලිම්වරුන්ට එරෙහිව කටයුතු කිරීම
- බුවනෙකබාහු රජු හා පෘතුගීසින් අතර මත ගැටුම් ඇති වීම
  - රජතුමා කතෝලික ආගම වැලඳ ගැනීම ප්‍රතික්ෂේප කිරීම
  - පෘතුගීසින් තම වෙළෙඳ භාණ්ඩ අධික මිලකට විකිණීම
  - කෝට්ටේ රාජ්‍යයේ නිෂ්පාදන අවම මිලකට මිලදී ගැනීම
- ධර්මපාල කුමරුගේ පිළිරුවක් පෘතුගාලයට යවා එයට ඔටුණු පැළඳවීම
- පෘතුගීසි වෙඩි පහරකින් බුවනෙකබාහු රජු මරණයට පත් වීම
- පෘතුගීසි ආරක්ෂාව මධ්‍යයේ ධර්මපාල කුමරු කෝට්ටේ පාලකයා බවට පත් වීම
- තෑගි ඔප්පුවකින් රාජ්‍ය උරුමය පෘතුගීසින්ට පැවරීම හා ධර්මපාල රජුගේ මරණින් පසු කෝට්ටේ නිත්‍යානුකූල අයිතිය පෘතුගීසින්ට ලැබීම

***(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2 +3 =05යි)***

( iv )
- උඩරට රජු සමග සාමකාමීව කටයුතු කිරීම
  - වෙළෙඳ සමාගමට පාඩු සිදුවන ගැටුම්වලින් වැළකීම
- උඩරට රජුගේ හොඳ හිත දිනා ගැනීමට කටයුතු කිරීම
  - තෑගි බෝග ලබා දීම
  - රජු හමුවීමට දූත පිරිස් යැවීම
  - රජු සමග ලිපි හුවමාරුව/ රජුට ගෞරව නාම භාවිත කොට ආමන්ත්‍රණය කිරීම
- රජුගේ ආගමික කටයුතු හා වෙනත් අවශ්‍යතා සඳහා සහාය ලබා දීම
  - උපසම්පදාව ගෙන ඒමට අවශ්‍ය නැව් ලබා දීම
- උපරිම ආර්ථික වාසි ලබා ගැනීමට ක්‍රියා කිරීම
  - විදේශිකයන් සමග වෙළෙඳ සම්බන්ධතා පැවැත්වීම අවහිර කිරීම
  - උඩරට හා පහතරට අතර කඩවත් වසා දැමීම
  - උඩරට රජුන් සමග ගිවිසුම් ඇතිකර ගැනීම
    - 1638 ගිවිසුම
    - 1766 ගිවිසුම
- උඩරට ආක්‍රමණය කිරීම
  - 1764 හා 1765 උඩරට ආක්‍රමණය කිරීම

***(මින් කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 3+3 = 06 යි)***

PAST PAPERS WIKI



CamScanner

## ප්‍රශ්න අංක 07

ඉගෙනුම් පලː

***කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ සිට සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ දක්වා තොරතුරු විග්‍රහ කරයි.***

7. (i) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ අනුව ශ්‍රී ලංකාව බෙදන ලද පළාත් අතුරෙන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) විසිවන සියවස ආරම්භයේ ශ්‍රී ලාංකික මධ්‍යම පන්තිය විසින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ කරන ලද ඉල්ලීම් **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ පිහිටුවන ලද විධායක කාරක සභා ක්‍රමය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන ලද පහත අංග පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

*A* - අග්‍රාණ්ඩුකාරවරයා

*B* - ද්විමණ්ඩල පාර්ලිමේන්තුව

*C* - අගමැති සහ කැබිනට් මණ්ඩලය (ලකුණු 06 යි)

(i) උතුරු පළාත

දකුණු පළාත

බස්නාහිර පළාත

නැගෙනහිර පළාත

මධ්‍යම පළාත ***(මින් තුනක් සඳහා ලකුණු 1 x 3 = 03 යි)***

(ii)
- ව්‍යවස්ථාදායක සභාවේ නිලනොලත් සාමාජික සංඛ්‍යාව වැඩි කිරීම
- වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම
- පළාත්බද නියෝජන ක්‍රමය අනුව ඒ ඒ පළාත් වෙනුවෙන් ඡන්ද බලයෙන් නියෝජිතයින් තෝරා ගැනීමට ඉඩ සැලසීම
- ව්‍යවස්ථාදායක සභාවේ බලතල වැඩි කිරීම

***(මින් කරුණු දෙකක් සඳහා ලකුණු 2x 2= 04යි)***

(iii)
- රාජ්‍ය මන්ත්‍රණ සභා සාමාජිකයන් කාරක සභා හතකට බෙදීම
- කාරක සභාවලට අයත් විෂය ක්ෂේත්‍ර
- ස්වදේශ කටයුතු
- කෘෂිකර්ම හා ඉඩම්
- පළාත් පාලනය
- සෞඛ්‍යය
- අධ්‍යාපනය
- ගමනාගමනය හා පොදු වැඩ
- කම්කරු, කර්මාන්ත හා වෙළෙඳාම
- බලය හා වගකීම බෙදී පැවතුන ක්‍රමයක් වීම
- කාරක සභා සභාපතිවරයා විෂය භාර ඇමතිවරයා වීම
- ලාංකික ඇමතිවරු හත් දෙනෙක් බිහිවීම
- පොදු ජනතාවට බලපාන යෝජනා ක්‍රියාත්මක කිරීම

උදාහරණ - ගොවිජනපද ව්‍යාපාරය

නිදහස් අධ්‍යාපනය

(සැකෙවින් විස්තර කිරීම අපේක්ෂා කෙරේ.)

***(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2+3 =05 යි)***



CamScanner

(iv) A - අග්‍රාණ්ඩුකාරවරයා

- ආණ්ඩුකාර තනතුර අහෝසි කොට අග්‍රාණ්ඩුකාර තනතුර ස්ථාපනය කිරීම
- බ්‍රිතාන්‍ය රජිනගේ මෙරට නියෝජිතයා ලෙස කටයුතු කිරීම
- නාමමාත්‍ර විධායක තනතුරක් වූ නිසා අගමැතිගේ උපදෙස් පරිදි ක්‍රියා කිරීම

B - ද්විමණ්ඩල පාර්ලිමේන්තුව

- රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙනුවට ද්විමණ්ඩල පාර්ලිමේන්තුව හඳුන්වාදීම
- ව්‍යවස්ථාදායක කටයුතු අයත් වීම
- මහජන මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් සභාව ද්විමණ්ඩල පාර්ලිමේන්තුවට අයත් වීම
- මහජන මන්ත්‍රී මණ්ඩලයට සාමාජිකයන් 101 ක් අයත් විම
- 95 ක් ඡන්ද කොට්ඨාස පදනම මත මහජන ඡන්දයෙන් තෝරා පත්කර ගැනීම
- ඉතිරි 06 සුළු ජාතීන් වෙනුවෙන් අගමැතිගේ උපදෙස් පරිදි අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කිරීම
- සෙනෙට් සභාවට සාමාජිකයන් 30 ක් අයත් වීම
    - 15 දෙනෙක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ද,ඉතිරි 15 අගමැතිගේ උපදෙස් පරිදි අග්‍රාණ්ඩුකාරවරයා විසින් ද පත් කිරීම
    - පාර්ලිමේන්තුවේ නිල කාලය වසර 05 ක් වීම

C - අගමැති හා කැබිනට් මණ්ඩලය

- අගමැති කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වීම
- නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බහුතර සහයෝගය ලැබූ තැනත්තා අගමැති ලෙස පත් කිරීම
- විධායක කටයුතු කැබිනට් මණ්ඩලයට අයත් වීම
- ආරක්ෂක හා විදේශ කටයුතු අගමැතිවරයා යටතේ පැවතිය යුතු වීම
- අගමැති උපදෙස් පරිදි ඇමති මණ්ඩලය පත් කිරීම
- අධිකරණ හා තවත් ඇමතිධුරයක් සෙනෙට් සභාවෙන් පත්වීම
- කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකිව යුතුවීම

*(කරුණු තුන විස්තර කිරීමට ලකුණු 3 +3 =06 යි)*

## III කොටස

## ප්‍රශ්න අංක 08

ඉගෙනුම් පල:

*ප්‍රංශ හා රුසියන් විප්ලවවල ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි.*

> **III කොටස**
>
> **8.** (i) ප්‍රංශ විප්ලවයට බලපෑ දාර්ශනික මතවාද ඉදිරිපත් කළ දාර්ශනිකයින් **තිදෙනකු** නම් කරන්න. (ලකුණු 03 යි)
>
> (ii) පහත සඳහන් සිදුවීම් ආරම්භ වීමට බලපාන ලද ආසන්න හේතුව **අනුපිළිවෙළින්** සඳහන් කරන්න.
>
> (*a*) අමෙරිකන් නිදහස් සටන
>
> (*b*) ප්‍රංශ විප්ලවය (ලකුණු 04 යි)
>
> (iii) ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
>
> (iv) රුසියන් විප්ලවයෙන් පසු එරට ඇති වූ වෙනස්කම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) මොන්ටෙස්ක්‍යු, රූසෝ, වෝල්ටෙයාර්

***(නම් තුන සඳහා ලකුණු 1x3 = 03 යි)***

(ii) (a) - බොස්ටන් තේ සාදය -බොස්ටන් වරායේ නවතා තිබූ තේ නැවකට අයත් තේ පෙට්ටි මුහුදට විසි කිරීම

(b) - බැස්ටීල් බන්ධනාගාරයට පහර දී, එහි සිටි සිරකරුවන් නිදහස් කිරීම

***(කරුණු දෙක සඳහා ලකුණු 2 x 2= 04 යි)***

(iii) - ප්‍රංශ රාජාණ්ඩුක්‍රමය බිඳ වැටීම

- මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳව ලොව පුරා උනන්දුවක් ඇති වීම

- 1791 මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය එළි දැක්වීම

- එහි ඇතුළත් අදහස්

    - සෑම රටවැසියෙකුටම නීති සම්පාදනය කිරීමේ කාර්යයට සම්බන්ධ වීමට අයිතියක් තිබේ.
    - සෑම පුරවැසියෙකුටම නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට හා කැමති ආගමක් ඇදහීමට අයිතියක් තිබීම
    - ප්‍රංශ ගොවි හා කම්කරු ජනතාවට සහන ලැබීම
    - ප්‍රංශයේ අස්ථාවර දේශපාලන ක්‍රමයක් ඇති වීම
    - දුර්වල දේශපාලන තත්වයෙන් නැපෝලියන් බොනපාට් ප්‍රයෝජන ගැනීම

***(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2+ 3 =05 යි)***

PAST PAPERS WIKI



CS CamScanner

(iv)
- සාර් පාලනය බිඳ වැටීම
- කෙරෙන්ස්කිගේ නායකත්වයෙන් යුත් රජය පෙරලා ලෙනින්ගේ නායකත්වයෙන් යුත් රජයක් පිහිටුවීම
- ජර්මනිය සමග පැවැති යුද්ධය අවසන් කර සාමය උදා කිරීම
- සමාජවාදී සමූහාණ්ඩුවක් ඇති වීම
- නව නිලධාරී පිරිසක් තනතුරුවලට පත් කිරීම
- රුසියානු,සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය යන නමින් හැඳින්වීම
- පෞද්ගලික ඉඩම් අයිතිය අහෝසි කිරීම
- කුඩා ගොවිපලවල් විශාල සමූහ ගොවිපලවල් බවට පත් කිරීම
- කර්මාන්තශාලා, බැංකු, ගමනාගමනය ජනසතු කිරීම
- පෞද්ගලික ව්‍යාපාර වෙනුවට පොදු ව්‍යාපාර පිළිගැනීම
- ගොවීන්ට ඉඩම් අයිතිය හිමිවීම

*(මින් කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 3 + 3 = 06 යි)*

## ප්‍රශ්න අංක 09

ඉගෙනුම් පල:

*පළමු හා දෙවන ලෝක යුද්ධ පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.*

9. (i) පළමුවන ලෝක මහා සංග්‍රාමයේ පරාජිත පිලට අයත් රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඇමරිකා එක්සත් ජනපදය පහත සඳහන් මහා සංග්‍රාමයන්ට සම්බන්ධ වීමට බලපෑ ආසන්නතම හේතුව **කෙටියෙන්** සඳහන් කරන්න.
(a) පළමුවන ලෝක මහා සංග්‍රාමය
(b) දෙවන ලෝක මහා සංග්‍රාමය (ලකුණු 04 යි)

(iii) දෙවන ලෝක මහා සංග්‍රාමය කෙරෙහි ජපානයේ ක්‍රියාකලාපය බලපෑ ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) ජර්මනිය, ඔස්ට්‍රියාව, තුර්කිය, බල්ගේරියාව, හංගේරියාව

*(මින් නම් තුනක් සඳහා ලකුණු 1x 3 = 03 යි)*

(ii) (a) - ඇමරිකන් ජාතිකයන් රැගත් ලුසිටානියා මගී නැව ජර්මන් සබ්මැරීනයක් මගින් ගිල්වා දැමීම

(b) - ජපානය විසින් පර්ල් වරායේ ඇමරිකානු නාවුක කඳවුරට බෝම්බ හෙලා විනාශ කිරීම

*(කරුණු දෙක සඳහා ලකුණු 2x 2= 04 යි)*



Past Papers Wiki
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(iii) - ආසියාවේ ජපන් අධිරාජ්‍යයක් බිහි කිරීමේ අරමුණින් කටයුතු කිරීම
- අමුද්‍රව්‍ය ලබා ගැනීමට හා නිමි ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා ආසියාතික ප්‍රදේශවලට පැමිණීම
- ආසියාතික ප්‍රදේශ බොහෝමයක් යුරෝපා යටත් විජිත බවට පත්ව තිබූ නිසා එම රටවල් සමග ගැටුම් ඇතිවීමේ පසුබිමක් නිර්මාණය වීම
- උතුරු චීනයේ මැන්චූරියාව ආක්‍රමණය කොට යටත් කර ගැනීම
- ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වී චීනයේ වරායයන් හා නගර කිහිපයක් අල්ලා ගැනීම
- දෙවන ලෝක යුද්ධය ආරම්භ වන විට ආසියාතු රටවල ආක්‍රමණිකයා බවට පත් වීම
- 1941 දී පර්ල් වරායේ ඇමෙරිකානු නාවුක හමුදා කඳවුරට පහර දී විනාශ කිරීම
- සිංගප්පූරුව, මලයාසියාව, බුරුමය, හොංකොං, බෝර්නියෝ, ජාවා, සුමාත්‍රා වැනි බ්‍රිතාන්‍ය යටත් විජිත අල්ලා ගැනීම
- බෙංගාල බොක්ක ප්‍රදේශයට හා ලංකාවේ කොළඹ හා ත්‍රිකුණාමලයට බෝම්බ හෙළීම
- මිත්‍ර පාක්ෂික හමුදා සමග දරුණු සටන් ඇති වීම

***(මින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 2+3 =05 යි)***

(iv) - අක්ෂ පිළ පරාජයට පත් වීම
- මිනිස් ජීවිත, දේපල හා ධන හානි සිදුවීම
- පරමාණු බෝම්බ හෙළීමේ ප්‍රතිඵල අනාගත පරම්පරා කෙරෙහි බලපෑම් කිරීම
- බ්‍රිතාන්‍ය හා ප්‍රංශ ජාතිකයන්ගේ අධිරාජ්‍යවාදී සංකල්ප බිඳ වැටීම
- යටත් විජිතවලට නිදහස ලැබීම
- මාර්ෂල් සැලැස්ම හඳුන්වා දීම
- ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් රුසියාව ලෝක බලවතුන් ලෙස නැගී සිටීම
- ලොව රටවල් රසක් බල කඳවුරු දෙකකට බෙදීම
- සීතල යුද්ධය හෙවත් නිරවි යුද්ධය ආරම්භ වීම
- එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම
- නොබැඳි ජාතීන්ගේ සංවිධානය බිහිවීම
- ජර්මනිය දෙකඩවීම
- නව රාජ්‍ය බිහිවීම
- යුද්ධයේ වැරදිකරුවන්ට දඬුවම පැමිණවීම

***(මින් කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 3 +3 =06 යි)***

PAST PAPERS WIKI

***



www.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library
CamScanner